TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබෑන්ක් පාර,
කොළඹ 5.
2019.10.30

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ නිලධාරීන් සහභාගී වීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සම්බන්ධවයි.</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත ලැබුණු පැමිණිල්ලකට අනුව 2019.10.24 දින මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි ප්‍රදේශයේ බීච් වේ හෝටලයේ පැවැත් වූ ස්වාධීන අපේක්ෂක එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතාගේ මැතිවරණ ප්‍රචාරණ රැස්වීමක් සඳහා රජයේ පාසල් කීහිපයක සේවය කරන විදුහල්පතිවරුන් සහභාගී වී ඇත (ඇමුණුම 01). මීට අදාල ජායාරූප මේ සමග අමුණා ඇත (ඇමුණුම 02).

මෙසේ දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ නිලධාරීන් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා සහභාගීවීම මගින් 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 2 (i) යන නියමය උල්ලංඝනය වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා නැගෙනහිර පළාත් සම්බන්ධීකාරක මිරින් තනොජන් හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තූතියි.
මෙයට,


විශ්වාසී,
Lakwijaya Bandara

ලක්විජය බණ්ඩාර,

ජාතික සම්බන්ධීකාරක [PPPR]


Reg No. GA 279 Chairperson: S.C.C. Elankovan Company Secretary: Charuni Gunawardana Directors: Anushika Amarasinghe Shreen Saroor Shyamala Gomez T. Someswaran Camena Guneratne Tony Senewiratne Pavithra Kailasapathy Pulasthi Hewamanna

| පාසලේ නම | විදුහල්පතිවරයාගේ නම |
|---|---|
| 01.කාත්තන්කුඩි ජමිඋල්ලාපිරින් විද්‍යාලය | ඒ.එල්.එම්. ෆාරුක් |
| 02.කාත්තන්කුඩි ෆාතිමා බාලිකා මහ විද්‍යාලය | එම්.එම්.එම්.යුනුස් |
| 03.මඩකලපුව පූනොච්චිමුනෙයි ඉග්‍රා මහා විද්‍යාලය | ඒ.බී.ඒ.රසූල් |
| 04.ආරෙයම්පදී කාන්ගේයනෝඩේ හිස්බුල්ලා විද්‍යාලය | ජේ.සිදීකීන් |
| 05.ආරෙයම්පදී ඔල්ලික්කුලම් අල් හම්රා විද්‍යාලය | ඒ.සී.එම්. රිෆාල් |
| 06.පුදිය කාත්තන්කුඩි දාරුස්සලාම් විද්‍යාලය | ඒ.එල්.මුනීර් අහමඩ් |
| 07.කාත්තන්කුඩි ශාවිය මහ විද්‍යාලය | අයි.එන්.ඒ.සලාම් මහත්මිය |
| 08.ආරෙයම්පදී හයිරාත් විද්‍යාලය | ඒ. කාලීල්දින් මහත්මිය |
| 09.ආරෙයම්පදී කාන්ගේයනෝඩේ ඉග්‍රා විද්‍යාලය | ඒ.සී.ආතම් අලී |





01 A.L.M. FAROOK




02
02

MMM YOONUS




03
03

ABA RASOOL




04
04

J. SIDEEKEEN



05
05

ACM RIFAI



06
06

AL MUNEER AHAMED




07
07

Mrs. INA SALAM



08
08

Mrs. A. KALEELDEEN



09
09

A C AATHAMALI .

